
# ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව පිළිබඳ සමීක්ෂණය

## ප්‍රධාන සොයාගැනීම්



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - සෝෂල් ඉන්ඩිකේටර්

මාර්තු 2024

## හැඳින්වීම

මෙම සංෂිප්ත වාර්තාවේ අරමුණ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් විසින් මෙහෙයවන ලද නවතම සමීක්ෂණය වන 'ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව' පිළිබඳ සමීක්ෂණයෙහි තෝරාගන්නා ලද ප්‍රධාන සොයාගැනීම් කිහිපයක් ඉදිරිපත් කිරීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව පිළිබඳ තේමාවන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් වත්මන් මහජන මතය ග්‍රහණය කර ගැනීමේ අරමුණින් මෙම සමීක්ෂණය සැළසුම් කරන ලදී. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය, ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නංවන ආයතනයන් පිළිබඳ විශ්වාසය, සංහිඳියාවේ ප්‍රගතිය පිළිබඳ මහජන තක්සේරුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන් පිළිබඳ ආකල්ප යනාදී මෙම සමීක්ෂණයෙහි සොයාගැනීම් මෙම සංෂිප්ත වාර්තාව මඟින් සාකච්ඡා කරනු ලබයි.

මෙම සමීක්ෂණයට දිස්ත්‍රික්ක 25 න් ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් හතරට (සිංහල, දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්) අයත් පුද්ගලයන් 1350 ක් සහභාගී වූහ. බහු-අදියර අහඹු ස්ථර නියැදි ක්‍රමයක් තුළින් තෝරා ගත් ප්‍රතිචාරකයින් අතර අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් මෙම සමීක්ෂණය මෙහෙය වන ලදී. ක්ෂේත්‍ර කටයුතු 2024 ජනවාරි 4 වන දින සිට 22 වන දින දක්වා පවත්වන ලද අතර, ඒ සඳහා ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරෙහි ක්ෂේත්‍ර සමීක්ෂකයන් 73 ක් (පුරුෂයන් සහ ස්ත්‍රීන්) සහභාගී කර ගන්නා ලදී. දත්ත එකතු කිරීමේ ක්‍රියාවලියෙන් පසු ජනගහනයේ දිස්ත්‍රික්කය සහ ජනවාර්ගික අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජීය විද්‍යාව සඳහා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.


# ප්‍රධාන සොයාගැනීම්

## ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය


ශ්‍රී ලාංකිකයන් අතර ප්‍රජාතන්ත්‍රවාදයට විශාල සහායක් පෙන්නුම් කරයි. සමීක්ෂණ සොයාගැනීම් අනුව (ප්‍රස්ථාර අංක 1) ශ්‍රී ලාංකිකයින්ගෙන් හතරෙන් තුනකට වඩා සිතන්නේ 'ඕනෑම ආකාරයේ ආණ්ඩුකවකට වඩා ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් සුදුසුය' බවයි. මෙම මතය සියලු ජනවාර්ගික ප්‍රජාවන් (සිංහල, දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්) අතර දක්නට හැකිය. වඩාත් වැදගත් දෙය නම්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ - සෝෂල් ඉන්ඩිකේටර් විසින් පසුගිය වසර 13 ක් තුළ (ප්‍රස්ථාර අංක 2) සිදු කරන ලද සමීක්ෂණයන්ට අනුව, මෙම ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන ප්‍රබල සහාය නොවෙනස්ව පැවැතීමයි. කෙසේවෙතත්, මෑතකාලීනව සිදු කරන ලද සමීක්ෂණ සොයාගැනීම්වලට අනුව සෑම ශ්‍රී ලාංකිකයින් දස දෙනෙකුගෙන් එක් අයෙක් එකඟ වන්නේ 'ඇතැම් අවස්ථාවලදී, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවකට වඩා ඒකාධිපති ආණ්ඩුවක් වඩාත් සුදුසු විය හැකි' බවට වන අදහසටයි. ඒකාධිපති ආණ්ඩුවකට පැවැති කැමැත්ත 2018 සිරිසේන-වික්‍රමසිංහ ආණ්ඩුවේ දේශපාලන ව්‍යාකූලත්වය මධ්‍යයේ වුවද ඉහළ මට්ටමක පැවැති බව එම සමීක්ෂණ මාලාව පෙන්වා දෙයි.

එබැවින්, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා දැඩි සහයෝගයක් ලැබුන ද, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සඳහා වන කලකිරීම වැඩි වන විට ඒකාධිපති පාලනයක් සඳහා වන සහයෝගය යළි පණගැන්වීමේ හැකියාවක් පවතින බව සමීක්ෂණ මාලාව පෙන්වා දෙයි.

ප්‍රස්ථාර 01 - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය - ජාතික සහ ජනවාර්ගිකත්වය අනුව




ප්‍රස්ථාර 02 - ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සහාය - වර්ෂය අනුව





## ආයතනයන් පිළිබඳ විශ්වාසය

ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සඳහා මහජන විශ්වාසය ඒ ආයතනයේ නීත්‍යානුකූලභාවයට අතිශයින් වැදගත් ය. කෙසේ වෙතත්, සෑම ආයතනයක්ම මහජන විශ්වාසය සෑම අවස්ථාවකම සහ එක හා සමානව අත් කරගෙන නැත. රටේ වඩාත්ම විශ්වාසදායක ආයතන යන තත්ත්වය හමුදාව සහ උසාවිය අත් කරගෙන ඇති බව සමීක්ෂණ මාලාවේ සොයාගැනීම්වලින් පෙනී යයි.

පසුගිය දශක කිහිපය තුළම පාහේ, මෙම ආයතන දෙක කෙරෙහි මහජන විශ්වාසය නොවෙනස්ව පැවතුනි. හමුදාව හා උසාවිය සමඟ සසඳන විට පොලිසියට ඇත්තේ සාපේක්ෂ වශයෙන් අඩු මහජන විශ්වාසයකි. පසුගිය වසර 13 තුළ පොලිසිය අත් කරගෙන ඇති විශ්වාසයේ ප්‍රමාණය විශාල ලෙස වෙනස් වී නැත. කෙසේ වෙතත්, හමුදාව හා උසාවිය සමඟ සසඳන විට ව්‍යවස්ථාදායක ආයතන සහ ව්‍යවස්ථාදායකයන් බිහි කරන ආයතන (දේශපාලන පක්ෂ) කෙරෙහි මහජන විශ්වාසය අඩු වී ඇති බව පමණක් නොව, පසුගිය දශකය තුළ පසුබෑමකට ද ලක්ව ඇති බව දක්නට හැකිය. පාර්ලිමේන්තුව එහි කාර්යභාරය ඉටු කිරීම පිළිබඳ මහජන විශ්වාසය, 2011 වන විට ශ්‍රී ලාංකිකයන්ගෙන් 63% කට පැවැති නමුත් 2024 දී එය 22% දක්වා පහත වැටී ඇත.

මෙම සමීක්ෂණ මාලාවේ අධ්‍යයනයට ලක් කළ ආයතන අතරින් දේශපාලන පක්ෂ කෙරෙහි ජනතාව තබා ඇත්තේ අවම විශ්වාසයකි. දේශපාලන පක්ෂ කෙරෙහි මහජන විශ්වාසය 2011 දී 56% වු නමුත් 2024 වන විට 19% දක්වා පහත වැටී ඇත. මෙම සොයාගැනීම් මඟින් ව්‍යාංගාර්ථයෙන් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාව වැනි රටවල ප්‍රජාතන්ත්‍රවාදය මුහුණ දෙන පෙර නොවූ විරූ අභියෝග පිළිබඳවය. බටහිර ප්‍රජාතන්ත්‍රවාදය තමන් සඳහා ඇති හොඳම පාලනය ලෙස ජනතාව විශ්වාස කළ ද, ඔවුන්ව පාලනය කිරීමට ඒ තුළින් තේරී පත් වූ නියෝජිතයන්ව ඔවුන් විශ්වාස කරන්නේ නැත.

ප්‍රස්ථාර 03 - ආයතනයන් පිළිබඳ විශ්වාසය - වර්ෂ අනුව





| ආයතන | | 2011 | 2013 | 2014 | 2015 | 2016 | 2018 | 2019 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජාතික ආණ්ඩුව | 76.9% | 84.2% | 78.5% | 74.5% | 68.7% | 38.8% | | 40.1% |
| | පළාත් පාලන ආණ්ඩුව | 66.8% | 72.7% | 68.2% | 67.4% | 64.6% | 43.6% | | 45.5% |
| | පොලිසිය | 67.5% | 73.5% | 67.8% | 71.6% | 63.5% | 56.4% | 70.5% | 66.9% |
| | හමුදාව | 83.6% | 86.4% | 81.4% | 79.1% | 79.0% | 81.9% | 86.1% | 84.5% |
| | උසාවි | 77.8% | 82.8% | 76.0% | 86.2% | 79.7% | 73.5% | 85.4% | 79.2% |
| | පාර්ලිමේන්තුව | 63.0% | 68.3% | 57.9% | 60.7% | 48.0% | 25.5% | 24.1% | 22.4% |
| | දේශපාලන පක්ෂ | 55.6% | 44.1% | 42.7% | 45.1% | 36.7% | 22.9% | 24.1% | 19.0% |


## සංහිඳියාව සඳහා වන ක්‍රියාවලියේ ප්‍රගතිය

ආරක්ෂක අංශ සහ එල්.ටී.ටී.ඊ සංවිධානය අතර පැවති යුද්ධය නිමා වී වසර 14ක් ගෙවී ගිය ද සංහිඳියාව අවසන් නොකළ කාර්යයක් ලෙස පවතී. සමීක්ෂණ සොයාගැනීම්වලට අනුව, පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් වත්මන් රජයේ ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (62.1%) සෑහීමකට පත්වන්නේ නැත. මෙම මතය සියලුම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් (සිංහල, දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්) අතර දක්නට හැකිය. 2018 වසරේ මෙයට සමාන සමීක්ෂණ ප්‍රතිඵල හා සසඳන විට, සංහිඳියාව සඳහා වන ක්‍රියාවලිය කෙරෙහි එකළ පැවැති රජයේ ප්‍රගතිය පිළිබඳව වැඩි පිරිසක් සිය අතෘප්තිය ප්‍රකාශ කර ඇත.

ප්‍රස්ථාර 04 - සංහිඳියාව සඳහා වන ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳ තෘප්තිමත්භාවය - ජාතික සහ ජනවාර්ගිකත්වය අනුව




ප්‍රස්ථාර 05 - සංහිඳියාව සඳහා වන ක්‍රියාවලියේ ප්‍රගතිය පිළිබඳ තෘප්තිමත්භාවය - වර්ෂ අනුව





## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ ආකල්පය


ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳව ශ්‍රී ලාංකිකයන්ට මධ්‍යස්ථ අවබෝධයක් ඇත. එය ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් (42.9%) දැනුවත් බව ප්‍රකාශ කිරීම තුළින් නිරූපණය වේ. ඒ අතරින්, සිංහල (40.4%) සහ මුස්ලිම් (35.7%) ප්‍රජාවන්ට වඩා දෙමළ (56.3%) සහ

මලෛයහ දෙමළ (69.8%) ප්‍රජාවන් අතර දැනුවත්භාවය සැලකිය යුතු ලෙස ඉහළ ය. තව ද, 2016 සිට 2024 දක්වා (2016 - 23%, 2017 - 31.4%, 2024 - 42.9%) පසුගිය වසර 8 ක කාලය තුළ මෙම දැනුවත්භාවය සැළකිය යුතු ලෙස වැඩි වී ඇත.

ප්‍රස්ථාර 06 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන් පිළිබඳ දැනුවත්භාවය - ජාතික සහ ජනවාර්ගිකත්වය අනුව





ප්‍රස්ථාර 07 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ දැනුවත්භාවය - වර්ෂ අනුව




සමීක්ෂණ සොයාගැනීම්වලට අනුව, ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට (52.3%) කැමැත්තක් දක්වන බව පෙනී යයි. මෙම මතය දරන අය 2016 සිට 2024 දක්වා පසුගිය වසර 8 ක කාලය තුළ සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර එය සිංහල (52.4%), දෙමළ (54.1%) සහ මුස්ලිම් (56%) ප්‍රජාවන් හරහා පිළිබිඹු වේ. එසේ වුව ද, වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවශ්‍ය වෙනස්කම් කිහිපයක් සමඟින් ඉදිරියට යා යුතු යැයි විශ්වාස කරන ශ්‍රී ලාංකිකයන් පිරිසක් ද සිටිති.

ප්‍රස්ථාර 08 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ කැමැත්ත - ජාතික සහ ජනවාර්ගිකත්වය අනුව




ප්‍රස්ථාර 09 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ කැමැත්ත - වර්ෂ අනුව



විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයක් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

ලිපිනයඃ නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5.

දුරකථනඃ +94 11 2081384-6

වෙබ්: http://www.cpalanka.org

සෝෂල් ඉන්ඩිකේටර් යනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි (CPA) සමික්ෂණ පර්යේෂණ ඒකකය වන අතර එය වර්ෂ 1999 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණි. එමගින් සමාජ හා දේශපාලන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර, වෘත්තීය සහ ස්වාධීන සමීක්ෂණ මධ්‍යස්ථානයක් සඳහා දීර්ඝ කාලීනව පැවැති රික්තකයක් පුරවා ඇත. මත විමසීම් හරහා අදහස් ප්‍රකාශ කිරීම ප්‍රජාතන්ත්‍රවාදය සවිබල ගැන්වීමේ මෙවලමක්ය යන දැඩි විශ්වාසයෙන් යුක්තව සෝෂල් ඉන්ඩිකේටර් ආරම්භයේ සිටම සමාජ-ආර්ථික හා දේශපාලන ගැටළු රාශියක් පිළිබඳව මත විමසීම් පවත්වනු ලබයි.

ලිපිනයඃ නො. 6/1B,1/1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5,

දුරකථනඃ +94 11 2584050

වෙබ්: www.cpalanka.org.survey-research